# සංක්ෂිප්තය

ගුරුවරුන් නිවාඩු ලබා ගැනීම නිසා පාසල තුළ ඇතිවන කළමනාකරණ ගැටලු වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ දැඩි ලෙස කතාබහට ලක්වන කරුණකි. අධ්‍යාපන පද්ධතියේ නිමැවුම වන දරුවා, රටේ අනාගත දිගානතිය තීරණය කරන තීරණාත්මක සාධකය බැවින් එහි ගුණාත්මකභාවයට සෘජුවම බලපාන ගුරුවරයා පිළිබඳ, ආන්දෝලනාත්මක ගැටලුවක් වන ගුරු නිවාඩු පිළිබඳව අධ්‍යයනය කිරීම අවශ්‍යම වේ. විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ එන සමීක්ෂණ පිරිසැලසුම් (Survey Research Desingn) ක්‍රමය අනුව, ගුරුවරුන් නිවාඩු ලබා ගැනීමේ ස්වභාවය, ගුරුවරුන් නිවාඩු ලබාගැනීම නිසා පාසල් මුහුණ දෙන ගැටලු, ගුරුවරුන් නිවාඩු ලබාගැනීම නිසා පාසල්වල ඇතිවන ගැටලු සඳහා පාසල් කළමනාකරණය අනුගමනය කරන ක්‍රියාමාර්ග, සොයා බැලීම හා ගුරු නිවාඩු අවම කිරීම සඳහා සංවර්ධනය යෝජනා ඉදිරිපත් කිරීම යන ප්‍රධාන අරමුණු ඔස්සේ මෙම අධ්‍යයනය සිදුකරන ලදී. මෙම අධ්‍යයනයේ නියැඳිය ලෙස සබරගමු පළාතේ රත්නපුර අධ්‍යාපන කලාපයේ පාසල් 09ක්, එහි විදුල්පතිවරු සහ නියෝජ්‍ය විදුල්පතිවරු 25ක්, ගුරුවරුන් 160ක් හා සිසුන් 160ක් යොදාගන්නා ලදී. සමානුපාතික ස්ථරායන නියැඳි ක්‍රමයෙන් 1AB, 1C, Type 2, Type3 පාසල් ග්‍රාමීය හා නාගරික ස්ථර දෙකම නියෝජනයවන පරිදි අහඹු ලෙස තෝරාගන්නා ලදී. විවෘත සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි, නිරීක්ෂණය, මූලාශ්‍ර පරීක්ෂාව යන ක්‍රම මගින් දත්ත රැස්කිරීම සිදුවිය. දත්ත විශ්ලේෂණයට අනුව ගුරුවරුන්ගේ නිවාඩු ලබාගැනීමේ සාමාන්‍ය අගය 23.4ක් විය. ගුරුවරයාගේ දරුවන් සංඛ්‍යාව (b=0.519), ගුරුවරයා පාසලට ඇති දුර (b=0.211), ගුරු නිවාඩු සමඟ ධන ශ්‍රිතික සබඳතාවයක් දක්වන අතර, ගුරුවරයාගේ වයස (b=-0.361)ක ඍණ ශ්‍රිතික සබඳතාවයක් දක්වන බව අනාවරණය විය. ප්‍රාථමික හා ද්විතීයික ලෙස ගුරු වර්ගය අනුව, ස්ත්‍රී පුරුෂ භාවය අනුව, ග්‍රාමීය හා නාගරික පාසල් අනුව ගුරුවරුන් ලබාගන්නා නිවාඩු ප්‍රමාණයන්ගේ වෙසෙසි වෙනසක් ඇති බව අනාවරණය විය. ප්‍රාථමික ගුරුවරුන්ට සාපේක්ෂව ද්විතීයික ගුරුවරුන් ද, නාගරික ගුරුවරුන්ට

සාපේක්ෂව ග්‍රාමීය ගුරුවරුන් ද, පිරිමි ගුරුවරුන්ට සාපේක්ෂව ගැහැනු ගුරුවරුන් ද, වැඩිපුර නිවාඩු ලබාගන්නා බව අනාවරණය විය. ගුරුනිවාඩු හා සේවා තෘප්තිය අතර ද, ගුරු නිවාඩු හා ගුරුවරයා, විදුහල්පතිවරයා සමග ඇති සබඳතාවය අතරද ඍණ ඍතික සබඳතාවයක් ඇති අතර, ගුරු නිවාඩු හා ගුරුවරයාගේ අධ්‍යාපන සුදුසුකම් අතර ධන ඍතික සබඳතාවයක් ඇති බව අනාවරණය විය. තුන්වන වර්ගය ( Type 3) ග්‍රාමීය පාසල්වල ඉහළම නිවාඩු ප්‍රතිශතය වාර්තා විය. තම දරුවන්ගේ අවශ්‍යතා සඳහා ගුරුවරුන් වැඩිම නිවාඩු ප්‍රමාණයක් ලබාගන්නා බව අනාවරණය විය. සතියේ සඳුදා දින අඩුම නිවාඩු ප්‍රතිශතය වාර්තා වූ අතර, සිකුරාදා දිනවල වැඩිම නිවාඩු ප්‍රතිශතය වාර්තා විය. පූර්ව දැනුම් දීමක් සහිතව නිවාඩු ලබාගන්නේ ගුරුවරුන්ගෙන් 25%ක් පමණක් විය. ගුරු නිවාඩු සිසුන් උපකාරක පන්ති කරා එළඹීමට සාධකයක් බව අනාවරණය විය. සහන ගුරුවරුන් යෙදීම, පැවරුම් ලබාදීම, උදෑසන, සවස සහ නිවාඩු දින පන්ති පැවැත්වීම මගින් ගුරුනිවාඩු නිසා ඇතිවන හානි ඌණ පූර්ණය කිරීමට පාසල් කළමනාකරණය වෙහෙසුන ද, ඒවා ඉහළ සාර්ථකත්වයක් දක්වන විසඳුම් නොවන බව අනාවරණය විය. ශ්‍රී ලංකාවේ සිසුන්ගේ අධ්‍යාපන සාධනය කෙරෙහි ගුරු නිවාඩුවල ඇති සුවිශේෂී බලපෑම තවදුරටත් විධිමත්ව අධ්‍යයනයකිරීමේ අවශ්‍යතාවය මතුවිය.

# Abstract

High rates of teacher absenteeism have adversely been affected especially in the notions of management of the school and the quality of education of school system. In contrast, due to the impasse of absenteeism of teachers, a range of problems and difficulties have emerged on role of principals, students as well as other teachers. In this context, the aim of this study is to examine the causative factors of teachers' absenteeism of different kinds of schools, especially rural and urban. This study used the multi stage stratified random sampling by selecting the samples of 25 principals and deputy principals, 160 teachers and 160 students from nine schools in Rathnapura education zone of Sabaragamuwa province, Sri Lanka. Selected samples represent the school types of 1AB, 1C, Type 2, Type 3 as well. The questionnaire survey, structured interviews, observations and documents were used as the equipment of data collection. More importantly, the quantitative statistical analysis techniques such as regression analysis, Pearson's Correlation analysis, and the ANOVA analysis were applied as the key data analysis methods. The analysis of the results were revealed that the mean value of the teachers' absence was 23.4. The causative factors such as number of children of teachers, the distance from the school, connections with the school principal, education qualifications of teachers showed positive correlations with the teacher absenteeism, amid the age of teachers and job satisfaction indicated negative correlations with teacher absenteeism. More importantly, significant differences of teacher absenteeism were demonstrated among the categories of primary and secondary teachers, rural and urban teachers and male and female teachers. In particular, the absence rate of the secondary teachers was higher than the primary teachers. On the other hand, the absence rate of the rural teachers was higher than the urban teachers. In addition, the absence rate of the female teacher was higher than the male teachers. Type 3 rural schools exemplified the highest rate of teacher absenteeism. Another important aspect that revealed by this study is the weekly variations of teachers' absenteeism. For example, the highest absenteeism rate observed in Friday of the week while the lowest indicated in Monday among all the

school categories. Only the 25% of teachers have informed their absence to the management prior to their leaves. Teachers' absenteeism have significantly been influenced students to motivate for the tuition classes. Even though, the school managements have often been implemented some of alternative solutions to teachers' absenteeism, such as replacing other teachers, giving assignments, arranging additional classes at the evening and holidays are observed as less effective practices. Therefore, this study suggested that it is required further researching on teachers' absenteeism of Sri Lanka in order to mitigate their adverse consequences on students' learning process and curriculum implementation.